

චන්ද්‍රිකා දත්ත මත පදනම් වූ


# ටූනා මත්ස්‍යය බිම් පුරෝකථන සේවාව

# ஆழ் கடல் மீன்பிடித் தளங்களுக்கான எதிர்வு கூறல்

---

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය

## கடல்சார் கடல் அறிவியல் தேசிய நிறுவனம் தேசிய நீர்வள ஆராய்ச்சி அபிவிருத்தி முகாமை




බහුදින යාත්‍රා සඳහා මසුන් ගැවසෙන ප්‍රදේශ පිළිබඳ පූරෝකථනය

**ஆழ் கடல் மீன்பிடித் தளங்களுக்கான எதிர்வு கூறல்**

නිකුත්කල දිනය **பிரசுரிக்கப்பட்ட திகதி** :

2026-11-02

| අක්ෂාංශ அகலாங்கு | | | දේශාංශ நெட்டாங்கு | | | ගැඹුර ஆழம் |
|---|---|---|---|---|---|---|
| අංශක பாகை | මිනිත්තු கலை | | අංශක பாகை | මිනිත්තු கலை | | බඹ பாகம் |
| 5 | 29 | N | 66 | 38 | E | 41 |
| 7 | 23 | N | 65 | 55 | E | 39 |
| 7 | 45 | N | 66 | 43 | E | 43 |

Service credits: "Generated using E.U. Copernicus Marine Service Information. GMI data are produced by Remote Sensing Systems and sponsored by NASA Earth Science funding

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**බහු දින යාත්‍රා සඳහා කාලගුණ අනාවැකිය**
**උතුරු අක්ෂාංශ 20 ත් දකුණු අක්ෂාංශ 10 ත් සහ නැගෙනහිර දේශාංශ 60 ත් 100 ත් අතර මුහුදු ප්‍රදේශ සඳහා**
(2026 නොවැම්බර් මස 02 දින පෙ.ව. 07.00 ට ඉදිරි පැය 24 සඳහා නිකුත් කරන ලදි.)

**දිවයින වටා වන මුහුදු ප්‍රදේශ**

බටහිර මධ්‍යම සහ ඊට යාබද නිරිතදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පවතින මුරාසු" **(Murasu)** සුළි කුණාටුව, **2026** නොවැම්බර් මස **01** වන දින පැය **2330** වන විට උතුරු අක්ෂාංශ **13.3°** සහ නැගෙනහිර දේශාංශ **83.0°** ආසන්නයේ, කන්කසන්තුරයේ සිට කි.මී. **480** පමණ උතුරට බරව ඊශාන දෙසින් කේන්ද්‍රගතව පැවතුනි.

මෙම පද්ධතිය ඉදිරි පැය **03** තුළ බටහිර මධ්‍යම බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය හරහා බටහිර-වයඹ දෙසට ගමන් කරමින් තවදුරටත් වර්ධනය වී ප්‍රබල සුළි කුණාටුවක් බවට පත්වීමට ඉතා වැඩි හැකියාවක් පවතී. ඉන් අනතුරුව, එය වයඹ දෙසට ගමන් කරමින් **2026** නොවැම්බර් මස **02** වන දින මධ්‍යම රාත්‍රියේ සිට **03** වන දින අලුයම් කාලය අතරතුර නෙල්ලෝර් සහ නර්සාපූර් අතරින් දකුණු ආන්ද්‍රා ප්‍රදේශ වෙරළ තීරය හරහා ප්‍රබල සුළි කුණාටුවක් ලෙස ඉන්දියානු ගොඩබිමට ඇතුළු වීමට වැඩි හැකියාවක් පවතී.

එමනිසා උතුරු අක්ෂාංශ **10** ත් **17** ත් සහ නැගෙනහිර දේශාංශ **80** ත් **90** ත් අතර මුහුදු ප්‍රදේශවල නැවත දැනුම් දෙන තුරු ධීවර සහ නාවුක කටයුතුවලින් වළකින ලෙසත් එම මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවික කටයුතු වල යෙදෙන ප්‍රජාවන් ආරක්ෂිත ප්‍රදේශ කරා යාත්‍රා කරන ලෙසත් උපදෙස් දෙනු ලැබේ.

එසේම මන්නාරම සිට කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවලත් නැවත දැනුම් දෙනතුරු ධීවර සහ නාවුක කටයුතුවලින් වැලකී සිටින ලෙසත් දැනුම් දෙනු ලැබේ.

මේ සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ඉදිරි අනාවැකි සහ නිවේදන පිළිබඳව අවධානයෙන් පසුවන ලෙස ධීවර සහ නාවුක ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

**වැසි තත්ත්වය:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

**සුළඟ:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත හෝ දකුණු දෙසින් හමන අතර සුළඟේ වේගය **පැ.කි.මී. (25-35)** පමණ වේ. **හලාවත සිට කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැ.කි.මී. (40-45) දක්වා ඉහළ යා හැක.**

**මුහුදේ ස්වභාවය:**

**හලාවත සිට කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල්ම දක්වා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු විය හැක.** දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශ මද වශයෙන් රළු වේ.

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං (පැ.කි.මී. 60-70) ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය

**බටහිර මධ්‍යම සහ ඊට යාබද නිරිතදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පවතින මුරාසු" (Murasu) සුළි කුණාටුව, 2026 නොවැම්බර් මස 01 වන දින පැය 2330 වන විට උතුරු අක්ෂාංශ 13.3° සහ නැගෙනහිර දේශාංශ 83.0° ආසන්නයේ, කන්කසන්තුරයේ සිට කි.මී. 480 පමණ උතුරට බරව ඊශාන දෙසින් කේන්ද්‍රගතව පැවතුනි.**

**මෙම පද්ධතිය ඉදිරි පැය 03 තුළ බටහිර මධ්‍යම බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය හරහා බටහිර-වයඹ දෙසට ගමන් කරමින් තවදුරටත් වර්ධනය වී ප්‍රබල සුළි කුණාටුවක් බවට පත්වීමට ඉතා වැඩි හැකියාවක් පවතී. ඉන් අනතුරුව, එය වයඹ දෙසට ගමන් කරමින් 2026 නොවැම්බර් මස 02 වන දින මධ්‍යම රාත්‍රියේ සිට 03 වන දින අලුයම් කාලය අතරතුර නෙල්ලෝර් සහ නර්සාපූර් අතරින් දකුණු ආන්ද්‍රා ප්‍රදේශ් වෙරළ තීරය හරහා ප්‍රබල සුළි කුණාටුවක් ලෙස ඉන්දියානු ගොඩබිමට ඇතුළු වීමට වැඩි හැකියාවක් පවතී.**

**<u>එමනිසා උතුරු අක්ෂාංශ 10 ත් 17 ත් සහ නැගෙනහිර දේශාංශ 80 ත් 90 ත් අතර මුහුදු ප්‍රදේශවල නැවත දැනුම් දෙන තුරු ධීවර සහ නාවුක කටයුතුවලින් වළකින ලෙසත් එම මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවික කටයුතු වල යෙදෙන ප්‍රජාවන් ආරක්ෂිත ප්‍රදේශ කරා යාත්‍රා කරන ලෙසත් උපදෙස් දෙනු ලැබේ.</u>**

**<u>එසේම මන්නාරම සිට කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවලත් නැවත දැනුම් දෙනතුරු ධීවර සහ නාවුක කටයුතුවලින් වැලකී සිටින ලෙසත් දැනුම් දෙනු ලැබේ.</u>**

**මේ සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ඉදිරි අනාවැකි සහ නිවේදන පිළිබඳව අවධානයෙන් පසුවන ලෙස ධීවර සහ නාවුක ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.**

**කාලගුණික තත්ත්වය:**

12N-17N, 80E-83E : බොහෝ ප්‍රදේශවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
EQ-07N, 80E-90E : බොහෝ ප්‍රදේශවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
සෙසු මුහුදු ප්‍රදේශ : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි.

**සුළං තත්ත්වය:**

10N-18N, 80E-87E : වාමාවර්තව / පැ.කි.මී. (40-50); විටින් විට පැ.කි.මී.(60-80) දක්වා.
සෙසු මුහුදු ප්‍රදේශ : ගිනිකොණ දෙසින් හෝ නිශ්චිත දිශාවකින් තොරව /පැ.කි.මී. (25-35).

**මුහුදේ ස්වභාවය:**

10N-18N, 80E-87E : රළු සිට විට ඉතා රළු.
සෙසු මුහුදු ප්‍රදේශ : මඳ වශයෙන් රළු.

<u>අරාබි මුහුද</u>

**කාලගුණික තත්ත්වය:**

EQ-05N, 70E-80E : බොහෝ ප්‍රදේශවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
EQ-05N, 60E-70E : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
සෙසු මුහුදු ප්‍රදේශ : ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**සුළං තත්ත්වය:**

EQ-05N, 60E-70E : වයඹ දෙසින් /පැ.කි.මී. (20-30); විටින් විට පැ.කි.මී. 40 දක්වා.
15N-20N, 60E-73E : ඊසාන දෙසින් /පැ.කි.මී. (25-35).
සෙසු මුහුදු ප්‍රදේශ : නිරිත දෙසින් හෝ නිශ්චිත දිශාවකින් තොරව / පැ.කි.මී. (20-30).

**මුහුදේ ස්වභාවය:**

EQ-05N, 60E-70E : මඳ වශයෙන් රළු, විටින් විට තරමක් රළු.
15N-20N, 60E-73E : මඳ වශයෙන් රළු
සෙසු මුහුදු ප්‍රදේශ : සාමාන්‍ය ස්වභාවයේ සිට මඳ වශයෙන් රළු දක්වා.

**<u>දකුණු ඉන්දියානු සාගරය</u>**

**කාලගුණික තත්ත්වය:**

EQ-10S, 60E-85E : බොහෝ ප්‍රදේශවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
සෙසු මුහුදු ප්‍රදේශ : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි.

**සුළං තත්ත්වය:**

EQ-10S, 60E-70E : දක්ෂිණාවර්තව / පැ.කි.මී. (30-40); විටින් විට පැ.කි.මී. 50 දක්වා.
EQ-10S, 75E-100E : ගිනිකොණ දෙසින් / පැ.කි.මී. (30-40); විටින් විට පැ.කි.මී. 50 දක්වා.
සෙසු මුහුදු ප්‍රදේශ : ගිනිකොණ දෙසින් හෝ නිශ්චිත දිශාවකින් තොරව / පැ.කි.මී. (20-30).

**මුහුදේ ස්වභාවය:**

EQ-10S, 60E-70E : තරමක් රළු, විටින් විට රළු.
EQ-10S, 75E-100E : තරමක් රළු, විටින් විට රළු.
සෙසු මුහුදු ප්‍රදේශ : සාමාන්‍ය ස්වභාවයේ සිට මඳ වශයෙන් රළු දක්වා.

****ගිගුරුම් සහිත වැසි ඇති වන විට තද සුළං සමඟ එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.**

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව**
**வளிமண்டலவியல் திணைக்களம்**
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : **07** MSW/26/11/02/01
වර්ණය : රතු

## තද සුළං සහ මුහුදු රළුවීම පිළිබඳ අනතුරු ඇඟවීමේ නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්
ඉදිරි පැය **24** සඳහා වලංගු වන පරිදි, **2026** නොවැම්බර් මස **02** දින පෙ.ව.**10.30** ට නිකුත් කරන ලදී.

**බෙංගාල බොක්ක ගැඹුරු මුහුදු ප්‍රදේශයේ යාත්‍රාකරන බහුදින ධීවර යාත්‍රා සඳහා සහ මන්නාරම සිට කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා වෙරළට ඔබ්බෙන්වන ගැඹුරු මුහුදු ප්‍රදේශ සඳහා.**

**ක්‍රියාත්මක වන්න!**


බටහිර-මධ්‍යම සහ ඊට යාබද නිරිතදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පවතින "මුරාසු" (Murasu) සුළි කුණාටුව, ප්‍රබල සුළි කුණාටුවක් දක්වා වර්ධනය වී ඇත. 2026 නොවැම්බර් 02 වැනි දින උදෑසන 05.30 වන විට, මෙම පද්ධතිය උතුරු අක්ෂාංශ 13.9° සහ නැගෙනහිර දේශාංශ 81.8° ආසන්නයේ කේන්ද්‍රගතව පැවතුණි.

මෙම "මුරාසු" ප්‍රබල සුළි කුණාටුව වයඹ දෙසට ගමන් කරනු ඇතැයි බලාපොරොත්තු වන අතර, නොවැම්බර් මස **02** දින මධ්‍යම රාත්‍රිය සහ **03** දින අළුයම් කාලය පමණ වන විට ආන්ද්‍රා ප්‍රදේශ් වෙරළ හරහා ඉන්දියානු ගොඩබිම වෙත ගමන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පහත සිතියමේ **"Warning"** කාණ්ඩයට අයත් මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැයට කිලෝමීටර **(70-80)** දක්වා වැඩි විය හැකි අතර, ගිගුරුම් සහිත තද වැසි ඇති විය හැකි බැවින් මෙම මුහුදු ප්‍රදේශ ඉතා රළු විය හැක.

එමනිසා උතුරු අක්ෂාංශ **10** ත් **17** ත් සහ නැගෙනහිර දේශාංශ **80** ත් **90** ත් අතර මුහුදු ප්‍රදේශවල නැවත දැනුම් දෙන තුරු ධීවර සහ නාවුක කටයුතුවලින් වළකින ලෙසත් එම මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවික කටයුතු වල යෙදෙන ප්‍රජාවන් ආරක්ෂිත ප්‍රදේශ කරා යාත්‍රා කරන ලෙසත් උපදෙස් දෙනු ලැබේ.

මන්නාරම සිට කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා ගැඹුරු මුහුදු ප්‍රදේශවලත් නැවත දැනුම් දෙනතුරු ධීවර සහ නාවුක කටයුතුවලින් වැලකී සිටින ලෙස දැනුම් දෙනු ලැබේ.




මෙම මුහුදු ප්‍රදේශවල කටයුතුකරන ධීවර සහ නාවුක ප්‍රජාව මේ පිළිබඳව අවධානයෙන් පසුවන ලෙසත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ඉදිරි නිවේදන සහ අනාවැකි සම්බන්ධයෙන් විමසිලිමත් වන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ.


කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

පුරෝකථනය කරන ලද ස්ථාන සහ තීව්‍රතා:

| දිනය | වේලාව | ස්ථානය (උතුරු අක්ෂාංශ/ නැගෙනහිර දේශාංශ) | කැළඹිලි ස්වභාවය |
|---|---|---|---|
| 2026-11-02 | පෙ. ව. 05.30 | 13.9/81.8 | ප්‍රබල සුළි කුණාටුවක් |
| 2026-11-02 | පෙ. ව. 11.30 | 14.2/81.1 | ප්‍රබල සුළි කුණාටුවක් |
| 2026-11-02 | ප. ව. 05.30 | 14.6/80.6 | ප්‍රබල සුළි කුණාටුවක් |
| 2026-11-02 | ප. ව. 11.30 | 15.1/80.1 | ප්‍රබල සුළි කුණාටුවක් |
| 2026-11-03 | පෙ. ව. 05.30 | 15.5/79.8 | සුළි කුණාටුවක් |
| 2026-11-03 | ප. ව. 05.30 | 16.0/79.5 | ගැඹුරු පීඩන අවපාතයක් |
| 2026-11-04 | පෙ. ව. 05.30 | 16.5/79.2 | පීඩන අවපාතයක් |

නිරීක්ෂණය කළ සහ පුරෝකථනය කළ ගමන් මාර්ගය:




Source : https://rsmcnewdelhi.imd.gov.in/